157

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 755/7—1993 පෙබරවාරි 24 වැනි බදාදා—1993.02.24

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී. 21/78 III.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු ඒ පනතේ 140 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

සී. එස්. කරුණාරත්න මිය,
ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

1993 පෙබරවාරි මස 15 වැනි දින,
කොළඹ දී ය.

**නියමාවලිය**

1. මේ නියමාවලිය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 1993 මාර්තු මස 01 වන දින සිට ක්‍රියාත්මක වන්නේය.

2. 1990 දෙසැම්බර් මස 27 වන දින අංක 642/9 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1990 අංක 2 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන (සංශෝධන) නියමාවලියෙන් අවසන් වරට සංශෝධිත, 1980 අප්‍රේල් මස 10 වන දින අංක 83/7 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1980 අංක 1 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය මෙයින් වැඩිදුරටත් පහත දක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි 10 වන ඡෙදයේ—

(අ) ඒ ඡෙදයේ (1) වන අනුඡෙදයේ (ළ) විෂයය ඉවත් කොට ඒ වෙනුවට පහත දක්වෙන විෂයය ආදේශ කිරීමෙන් :—

"(ළ) ආයතනයේ ආසන්නතම හිටපු අධ්‍යක්ෂවරයා ;"

(ආ) ඒ ඡෙදයේ (1) වන අනුඡෙදයේ (ඒ), (ඔ), (ඕ), (ක), සහ (ග) විෂයයන් ඉවත්කොට, ඒ වෙනුවට පහත දක්වෙන විෂයයන් ආදේශ කිරීමෙන් :—

"(ඒ) පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාල වල සියළු වෛද්‍ය පීඨවල පීඨාධිපතිවරයන් ;

(ඔ) පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාල වල සියළු දන්ත වෛද්‍ය පීඨවල පීඨාධිපතිවරයන් ;"

(ඇ) ඒ ඡෙදයේ (2) වන අනුඡෙදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දක්වෙන අනුඡෙදය ආදේශ කිරීමෙන් :—

"(2) (අ) පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාල වල වෛද්‍ය පීඨවල එක් එක් පීඨ මණ්ඩලය විසින්, ඒ එක් එක් පීඨවල අධ්‍යයන අංශ ප්‍රධානීන් අතුරින් එක් පීඨයකින් එක් සාමාජිකයකු බැගින් වන සේ තෝරා පත්කර ගනු ලැබූ සාමාජිකයන් ;

(ආ) පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාල වල දන්ත වෛද්‍ය විද්‍යා පීඨවල එක් එක් පීඨ මණ්ඩලය විසින් ඒ එක් එක් පීඨවල අධ්‍යයන අංශ ප්‍රධානීන් අතුරින් එක් පීඨයකින් එක් සාමාජිකයකු බැගින් වන සේ, තෝරා පත්කර ගනු ලැබූ සාමාජිකයන් ;